ජනමාධ්‍ය සැම විටම සිය තොරතුරු නිරවද්‍ය බවට තහවුරු කරගැනීම සඳහා සෑම සාධාරණ ප්‍රයත්නයක්ම දැරීම අනිවාර්ය කරුණකි. විශේෂයෙන්ම කොවිඩ්-19 වාර්තාකරණයන් සඳහා සත්‍ය සහ තහවුරු කරන ලද මූලාශ්‍ර පමණක් භාවිතා කරන ලෙස ශ්‍රී ලංකා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද නිර්දේශයෙහිද දැක්වේ.

එසේ වුවත් අරුණ පුවත්පතේ කතුවැකිය ඔස්සේ නිරවද්‍ය නොවන කරුණක් දැක්වී ඇත. මෙය ලියැවී තිබුණේ කොවිඩ්-19 සමයේ ඉස්ලාම් භක්තිකයින්ගේ අවසන් කටයුතු පිළිබඳව මේ දිනවල නැගෙන තර්ක විතර්ක පසුබිම් කරගනිමිනි.

කොවිඩ්-19 ආසාදිතයෙකුගේ මෘතදේහයක් භූමදාන කරන්නේ නම් අඩි 8 ක් ගැඹුරට වල කැපිය යුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානය නියම කරන්නේ යැයි අරුණ කතුවැකිය කියා සිටියද, එය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අනිල් ජාසිංහ විසින් ප්‍රකාශිත කරුණක් විනා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන්හි සඳහන් වන්නක් නොවේ.
මෙවන් සංවේදී මාතෘකාවක් පිළිබඳව කරුණු දැක්වීමේදී තහවුරු කරන ලද, නිවැරදි තොරතුරු දැක්වීමට ජනමාධ්‍ය වගකීම් සහගත නොවීම මෙහි ඇති ගැටළුවයි.

විශේෂයෙන්ම කොවිඩ්-19 පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ජනමාධ්‍යයන් එක්වරක්, දෙවරක් නොව තුන්වරක් ප්‍රවේසම් විය යුතු බවත්, සැමවිටම විශ්වසනීය මූලාශ්‍ර පදනම් කරගනිමින් නිවැරදිම කරුණු දැක්විය යුතු බවත් අපි මෙසේ නැවත නැවතත් සිහිපත් කරමු.

මූලාශ්‍ර:
https://apps.who.int/iris/bitstream/handle/10665/331538/WHO-COVID-19-lPC_DBMgmt-2020.1-eng.pdf
https://www.facebook.com/deranaaruna/videos/3640252492712366/

සැලකිය යුතුයි: ඉහත සඳහන් වන කරුණු පදනම් වී ඇත්තේ අදාළ පෝස්ටු පළ කෙරෙනා මොහොත වන විට ලබාගැනීමට තිබූ වඩාත්ම යාවත්කාලීන තොරතුරු මත බව කරුණාවෙන් සලකන්න. ස්තූතියි.

#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #Aruna
— with World Health Organization (WHO) and WHO Sri Lanka.